# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රථගාල සහ ගොඩනැගිලි සම්බන්ධක මාර්ග සඳහා ආතනීය රෙදි ආවරණ ව්‍යුහ (Tensile Fabric Sheds) සැපයීම සහ ස්ථාපනය කිරීම

**කොන්ත්‍රාත් අංකය : TRC/ADM/01/24/03/34-1**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් පහත විස්තර කර ඇති පරිදි අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකාව, දරන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රථගාල සහ ගොඩනැගිලි සම්බන්ධක මාර්ග සඳහා ආතනීය රෙදි ආවරණ ව්‍යුහ (Tensile Fabric Sheds) සැපයීම හා ස්ථාපනය කිරීම පිණිස යෝග්‍ය සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

**කාර්යය සඳහා අදාළ විෂය පථය**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රථගාල හා ගොඩනැගිලි සම්බන්ධක මාර්ග සඳහා අවශ්‍ය ආතනීය රෙදි ආවරණ ව්‍යුහයන් (Tensile Fabric Sheds) සැපයීම සහ ස්ථාපනය කිරීම.

**ස්ථානය** - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
276, ඇල්විටිගල මාවත, කොළඹ 08.

**වැඩ නිම කිරීම සඳහා ලබා දෙන කාලය** – දින 30 කි.

01. මෙම ප්‍රසම්පාදනය ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ සිදු කරනු ලැබේ.

02. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබීම සඳහා සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත කර නොතිබියයුතු අතර, වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් ද තිබිය යුතුය.

03. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සපුරාලිය යුතු අවශ්‍යතා වන්නේ ;
    - පසුගිය වසර පහක කාලය තුළ සිදුකර ඇති ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 15 ක් විය යුතුය.
    - පසුගිය වසර 05 ක කාලසීමාව තුළ, මෙම කාර්යයේ ස්වභාවයට හා සංකීර්ණත්වයට සමාන වූ රුපියල් මිලියන 15 ක් හෝ ඊට වැඩි වටිනාකමකින් යුත් අවම වශයෙන් එක් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් සාර්ථකව නිම කර තිබීමේ පළපුරුද්ද ලංසුකරු සතු විය යුතුය.

04. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට මෙම ප්‍රසම්පාදනයට අදළ වැඩිදුර විස්තර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයෙන් ලබාගත හැකි අතර, වැඩ කරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන සහ ආයතනික කටයුතු අංශ කාර්යාලයේදී ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකිය.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.08.13 සිට 2026.08.25 දක්වා සතියේ රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා රු. 5,000.00 ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් මුදලින් ගෙවා, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකාව පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ / පාලන හා ආයතනික කටයුතු වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.

06. ලංසු 2026.08.28 දින ප.ව. 2.00 හෝ එදිනට පෙර, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ – 08 යන ලිපිනය වෙත ලැබෙන සේ භාරදිය යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම සහභාගී වීමට කැමති ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

07. සෑම ලංසුවක් සමගම රු. 250,000.00 ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එම ඇපකරය 2026.08.28 දින සිට 2026.12.11 දින දක්වා බලපැවැත්විය යුතුය. (එම කාලසීමාව ලංසු වලංගු කාලය අවසන් වීමෙන් අනතුරුව තවත් දින 28 ක කාලයක් සඳහා වලංගු විය යුතුය)

08. ලංසු ඉදිරිපත් කිරීමට පෙර පැවැත්වෙන පූර්ව ලංසු රැස්වීම 2026.08.20 දින පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දී පැවැත්වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,**
**අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**
**2026.08.13**